සමාගම් අංක පී වී 76479 යටතේ 2011 ජනවාරි මස 10 වැනි දින සංස්ථාගත කොට ඇති අතර එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 05, කිරුල පාර, අංක 36 හි පිහිටා ඇත.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

06-71

---

## සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (2) වගන්තියට අනුගාමීව පහත සඳහන් සමාගමේ නම (8 වැනි වගන්තියට අනුගාමීව) 2011 අප්‍රේල් මස 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කරන ලද බවට මෙයින් ප්‍රසිද්ධියේ නිවේදනය කරනු ලැබේ :-

සමාගමේ මීට ප්‍රථම නම : ජනතා ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 9457
සමාගමේ ලිපිනය : අංක 321, කඩුවෙල පාර, කොස්වත්ත, තලංගම
නව නාමය : ජේ එෆ් ඇන්ඩ් අයි පැකේජින් (ප්‍රයිවට්) ලිමිටඩ්

හේමන්ත සනත් තෙන්නකෝන්,
සමාගම් ලේකම්.

අංක 295 ඊ,
පුවක්ගහදෙනිය පාර, හෝකන්දර.

06-72

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු :-

ලියාපදිංචි සමාගමේ නම : මිතාරා ඉවෙන්ට් මැනේජ්මන්ට් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 78482
ලියාපදිංචි කළ දිනය : 2011.04.26
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 25, තෙවන මහල, මයිල් පෝස්ට් ඇවනිව්, කොළඹ 03.

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

06-73/1

## ටෙක්ස් නයින් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

පී වී 16276

2007 අංක 7 දරන සමාගම් පනතේ 320 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

2011 මැයි මස 16 වැනි දින අංක 1, 3 වැනි හරස් පටුමග, බොරුපන, රත්මලාන යන ස්ථානයේ දී පැවැති උක්ත සමාගමෙහි කොටස් හිමියන්ගේ අති විශේෂ මහ සභා රැස්වීමේ දී පහත සඳහන් විශේෂ යෝජනාව සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ :-

"2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදනවලට අනුගතව ඉහත සඳහන් සමාගම, ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කෙරේ".

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

06-73/2

---

## ටෙක්ස් නයින් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

පී වී 16276

2007 අංක 7 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

2011 මැයි මස 16 වැනි දින අංක 1, 3 වැනි හරස් පටුමග, බොරුපන, රත්මලාන යන ස්ථානයේ දී පැවැති උක්ත සමාගමෙහි ණය හිමියන්ගේ රැස්වීමේ දී පහත සඳහන් විශේෂ යෝජනාව සම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ :-

"2007 අංක 7 දරන සමාගම් පනතේ ප්‍රතිපාදනවලට අනුගතව ඉහත සඳහන් සමාගම, ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරනු ලබන අතර අංක 453/1, (පළමු මහල) හැව්ලොක් පාර, කොළඹ 06 යන ලිපිනයෙහි ඔබ්‍රි බර්නා(ර්)ඩ් දේවේන්ද්‍ර සවරිමුත්තු සමාගමේ ඈවරකරු වශයෙන් පත් කරනු ලැබේ".

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

06-73/3

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බත්තරමුල්ල, ජයවඩනගම, අංක 4/බී/100 හි පදිංචි ජා. හැ. අංක 651720265 වී හිමි වටවලගෙදර සිසිර සමන්ත හේරත්බණ්ඩා වන මම, ඉහත කී ශ්‍රී ලංකා ජනරජයේ බත්තරමුල්ල, ජයවඩනගම, අංක 4/බී/100 හි පදිංචි ජා. හැ. අංක 428202236 වී හිමි , මහගුරුගේ නන්දාවතී යන අයට ප්‍රසිද්ධ නොතාරිස් අතුලසිරි රණගල මහතා විසින් සහතික කරන ලද අංක 295 හා 1996 මැයි මස 05 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් දෙන ලද ඇටෝර්නි බලය මෙයින් අවලංගු කර අහෝසි කරමි.

ඉහත කී ඇටෝර්නි බලකාරිය විසින් ඉහත කී ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාරව මින්පසුව කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීම් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

වටවලගෙදර සිසිර සමන්ත හේරත්බංඩා.

06-74

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය යි.

සමාගමේ නම : එල් ඕ එල් සී ෆැක්ටර්ස් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී බී 4633
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

සී. එස්. එමානුවෙල්,
සමාගම් ලේකම්.

2011 අප්‍රේල් මස 11 වැනි දින.

06-75

### ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට මෙයින් දැනුම් දෙනු ලැබේ :-

සමාගමේ නම : කිංග්ස්වේ ට්‍රාන්ස්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 77684
සංස්ථාපනය කළ දිනය : 2011 මාර්තු 10
ලියාපදිංචි කාර්යාලය : අංක 164/3/6,ඩී. බී. කටුගම්පල මාවත, කොතලාවල, කඩුවෙල
සමාගමේ ලේකම්ගේ නම : ඩබ්ලිව්. ඩී. ගමගේ.

සමාගම් ලේකම්.

06-76

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2011 ජුනි මස 29 වැනි දින පෙ.ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කටුනායක - සීදුව නගර සභා සීමාව ඇතුළත කටුනායක පිහිටි මීගමුව පාරේ වරිපනම් අංක 1265/27 දරන ඒ මත වූ ගහකොළ, පලතුරු සහ සියලුම දේ සමග වන අඹගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් සාදන ලද වර්ෂ 1983 ක් වූ අගෝස්තු මස 24 වැනි දිනැති අංක 361/83 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් සලකුණු කර දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් සාදන ලද වර්ෂ 1990 ක් වූ පෙබරවාරි මස 19 වැනි දිනැති අංක 1394/බී/90 දරන පිඹුරේ ලොට් ඩී වශයෙන් දැක්වෙන සහ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් සාදන ලද වර්ෂ 1990 ක් වූ පෙබරවාරි මස 19 වැනි දිනැති අංක 361/83 දරන පිඹුරේ ලොට් 3ඒ සහ 3 බී වශයෙන් දැක්වෙන මාර්ග රක්ෂිත මතින් සහ ඒ ඔස්සේ මාර්ග අයිතිවාසිකම ද සමග වේ.

(අ. 0, රූ. 0, පර්. 16.25)

කළුතර කෝරාළගේ දොන් දිනුක ක්ලැරන්ස් හේමාල් විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රී විසින් ලියා සහතික කරන ලද අංක 1888 සහ 2010.02.17 දිනැති උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.05.27 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම සුඩර් ඔලි පුවත් පත් සහ එදින *ගැසට් පත්* ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* කොළඹ සිට මීගමුව පාරේ කිලෝමීටර 30 ක් පමණ මීගමුව දෙසට ගමන්කළ විට (ගුවන් තොටුපළ හන්දියේ සිට කිලෝ මීටර් 2.3 ක් පමණ ඉදිරියට යන විට) හමුවන සෙන්ට් සෙබස්තියන් නිවාස යෝජනා ක්‍රමය අසළින් වමට ඇති ග්‍රාමෝදය මාවතට හැරී මීටර් 100 ක් පමණ ගමන් කළ පසු දකුණු පසට හමුවන අඩි 10 ක් පළල පිවිසුම් මාර්ගයට පිවිස මීටර් කීපයක් ඉදිරියට ගමන් කළ විට අදාළ දේපළට පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසාන වූ විගස ගැනුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැනුම් මුදලෙන් 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% ද (සියයට දෙකහමාරක්),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැනුම් මිලෙන් පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු සහ අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු, නීති පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 2565573/2565565.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් - තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777-672082, ෆැක්ස් : 2871184.

06-79

## සෙලාන් බැන්ක් පී. එල්. සී. - රත්නපුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

රත්නපුර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මීහිටිය ගමේ පිහිටි මීහිටියාවත්ත නොහොත් ඇටකෙහෙල්අරාවේ වත්ත (කොටසක්) නමැති බලයලත් මානක එෆ්. සී. ඩඩ්ලි හෙට්ටිආරච්චි විසින් 1994.05.27 වැනි දින සාදන ලද අංක 2297 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 2 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 60. (ඉහත කී පිඹුරේ සඳහන් ලොට් 4 තුළ උඩින් හා දිගේ මාර්ගය පාවිච්චි කිරීමේ සම්පූර්ණ අයිතිය ද සමග).

*දේපළට පිවිසීම*.- රත්නපුර නගරයේ සිට මහ වීදියේ අවසානය දක්වා පැමිණ ශ්‍රී පාද මාවතට (මහවෙල පාර) හැරී කි. මී. 5ක් පමණ මහවෙල පාරේ 6/2 බෝක්කුව දක්වා පැමිණ වමට හැරී පුද්ගලික පාරට ඇතුළු වී ස්වල්ප දුරක් ගියවිට අදාළ දේපළ පිහිටා තිබේ.

මෙම දේපළ දෙදෙනාම රත්නපුර පදිංචි මහමද ආරච්චිගේ රෝහිත නිල්මිණ දයාසේන සහ ජාගොඩගේ වසන්ති රේණුකා රත්නපාල යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2011ක් වූ ජූනි මස 22 වැනි දින පෙ. ව. 10.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2010.10.15 දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2010.09.23 දින ද ඩේලිමිරර්, ලංකාදීප සහ 2010.09.29 දින තිනකුරල් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90%ක්වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී (නීති), සෙලාන් බැන්ක් පී. එල්. සී., සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456275/011-2456270.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර,
වටපුළුව-මහනුවර.
දුරකථන අංක : 081-2211025/071-4755974, ෆැක්ස් : 081-2211025.

06-46

## මහජන බැංකුව - ජාඇල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වැනි වගන්තිය යටතේ වටිනා දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා ඇල ප්‍රාදේශීය සභා සීමාවට අයත්, ඒකල ග්‍රාමයේ පිහිටි, ගාල්ල එස්ටේට් ලෙස හැඳින්වෙන පහත මාලය සම්පූර්ණ කරන ලද අංග සම්පූර්ණ නිවසක් සහිත ඉඩම.

ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූඩ් 0, පර්. 10.25

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජාඇල නගර ප්‍රාදේශීය සභා සීමාවට අයත්, ඒකල ග්‍රාමයේ පිහිටි බිම් කොටස.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 0, පර්. 10.00

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2011 ජූනි මස 30 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2011 මාර්තු මස 25 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, පුවත්පත් ද (2011 අප්‍රේල් මස 21 වැනි දින ඩේලි නිවුස්, දිනමිණ, තිනකරන්) බලන්න.

*දේපළට පිවිසීම*.-ජාඇල නගර මධ්‍යයේ සිට මිනුවන්ගොඩ මාර්ගයේ මීටර් 300 ක් පමණ ගිය විට පාරේ වම්පස රජ මාවත හමුවේ. එහි හැරී කිලෝමීටර් 1.6 ක් ගමන් කරන විට කර්මාන්ත පුර හන්දිය හමුවේ. එම ස්ථානයෙන් නැවත වමට ඇති දෙහියාගාත පාරේ මීටර් 200 ක් පමණ දුරකින් දකුණට ඇති යෝජිත වතුර ටැංකි ව්‍යාපෘතිය පාරේ මීටර් 80 ක් පමණ ගිය විට රණසිංහ හෝම්ස් නිවාස සංකීර්ණය හමුවේ. එයට ඇතුළුවන මාර්ගයේ මීටර් 300 ක් ගිය විට කෙළවර දකුණු පස මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිග තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ සහ සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැනුම් මිලෙන් 90%(සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ වෙත ගෙවිය යුතු වේ.

ඔප්පු සහ අනෙකුත් විස්තර පහත ලිපිනයෙන් ලබාගත හැකිය:- ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ගම්පහ ප්‍රාදේශීය සභා කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.

වැඩි විස්තර සඳහා දුරකථන අංක 033-2222325, 033-2225008, 033-2231901 අමතන්න.

ෆැක්ස් අංකය : 033-2226165, 033-2226741.

ඉහත සඳහන් කළ පරිදි දින 30 ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතියලත්, සියවසකට අධික
කලක් ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ
සහ දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24 ටොරින්ටන් පාර,
මහනුවර,
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com

06-82

---

HNB - 123 - 11.

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී - මීගමුව ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2009.09.30 දිනැති සහ අංක 2839 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම නෙවිල් රොඩ්රිගු නොහොත් වර්ණකුලසූරිය නෙවිල් මැක්ෂිමස් රොඩ්රිගු සහ වර්ණකුලසූරිය ජගත් හර්මන් පෝල් ප්‍රනාන්දු යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී 2011 ජුනි මස 21 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ විස්තරය.-* වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ (මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ) පිටිගල් කෝරළේ මැද පත්තුවේ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා සීමාවේ, හොරගොල්ල ගමේ මීගමුව-හලාවත අධිවේගී පාරේ, වරිපනම් අංක 47 ඒ හි කොහොඹගහවත්ත නොහොත් අඹගහවත්ත නොහොත් දෙහිගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. පී. එස්. සමරතුංග විසින් 2006.01.06 දින මැන සාදන ලද අංක 5951 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 20.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.05.13 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.05.13 දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* මීගමුව නගර මධ්‍යයේ සිට හලාවත පාරේ (කොළඹ පුත්තලම මහා මාර්ගයේ) කි. මී. 23ක් මාරවිල දෙසට ගොස් මාරවිල ඔර්ලෝසු කණුව හන්දියෙන් මොබ්බට මීටර් 40ක් පමණ පෙර දකුණු අත පැත්තේ අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසි කරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් (2.5%) ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද

වේ. ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංකය : 2661826, 2661835 ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 -1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441
0714 -424478
ෆැක්ස් අංකය : 0112 -345975.

06-83

**යූනියන් බැංක් ඔෆ් කලම්බු පී. එල්. සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. එල්. ජී. ධම්මික සිල්වා විසින් යූනියන් බැංක් ඔෆ් කලම්බු පීඑල්සී (යූනියන් බැංකුව) නමට ලියා සහතික කරන ලද 2009.07.24 දින සහ අංක 1194 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මිහිඳුකුලසූරිය ජෝසප් මෙරිල් ප්‍රනාන්දු යන අය බන්ධනදායි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී යූනියන් බැංක් ඔෆ් කලම්බු ලිමිටඩ් (යූනියන් බැංකුව) ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත උපලේඛනය විස්තර කර ඇති දේපළ වර්ෂ 2011 ජූලි මස 05 වැනි දින පෙ.ව. 11.30 ට හා ප.ව. 12.30 ට පිළිවෙලින් එම දේපළ පිහිටි ස්ථානයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය*

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, පිටිපන පිහිටි "මාවෙල" නමැති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් මැන සකස් කරන ලද 1989.03.16 දින සහ පිඹුරු අංක 1264 හි ලොට් අංක 1 දරන කොටස (මෙය ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා බලයලත් මානකතැන විසින් නැවත මැන සකස් කරන ලද 2007.05.19 දින සහ පිඹුරු අංක 5855 ඒ නිරූපිත ඉඩම් කොටස වේ) එකී පිඹුරේ කැබලි අංක 3 හි මාර්ග අයිතිය සමග ප්‍රමාණය පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20) සහ

2. එකී "මාවෙල" නමැති ඉඩමේ කැබලි අංක 2බී වශයෙන් ටී. සී. එස්. ප්‍රනාන්දු බලයලත් මානකතැන විසින් 1984.02.25 දින මැන 1986.09.02 දින බෙදා වෙන් කරන ලද පිඹුරු අංක 34/1984 හි නිරූපිත ඉඩම් කොටස සහ පිඹුරු අංක 2525 හි කැබලි අංක 1 ඒ හි මාර්ග අයිතිය සමග (මෙය ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා බලයලත් මානක තැන විසින් නැවත මැන සකස් කරන ලද 2007.05.19 දින සහ පිඹුරු අංක 5855 හි නිරූපිත ඉඩම් කොටස වේ)

ප්‍රමාණය : පර්චස් දහ අටයි දශම පහ (අ. 0 ෲ. 0 පර්. 18.5)

*පිවිසීම.*- මීගමුව නගරයේ සිට මීටර් 500 ක් ගමන් කිරීමේ දී හමුවන මුන්නක්කරේ පාළම ළඟින් වමට හැරී මීගමුව - පමුණුගම පාරේ කි. මී. 2.7 ක් පමණ ගමන් කොට දකුණට ඇති තාර පාරේ (පිටිපන රෝමානු කතෝලික පල්ලිය පාරට යාබද) මීටර් 100ක් ගමන් කොට ක්‍රීඩාංගනය අසළින් නැවත දකුණට හැරී මීටර් 250 ක් මැද පිටිපන පාරේ ගමන් කොට නැවත දකුණට හැරී මෙම ඉඩමට පිවිසීමට ඇති මාර්ගයේ මීටර් 35 පමණ ගමන් කිරීමේ දී අදාළ දේපල එම පාරේ දකුණු පැත්තේ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2011.03.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද 2011.03.13 වැනි දින දිවයින - ඬේලිනිවුස්, තිනකරන් පත්‍රවල පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා 1% (සියයට එකයි),
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැනුම් මිලෙන් 2 1/2%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැනුම් මිලෙන් 90% ක් (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත දී යූනියන් බැංක් ඔෆ් කලම්බු පීඑල්සී (යූනියන් බැංකුව) ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා කළමණාකරු (නීති අංශය), යූනියන් බැංක් ඔෆ් කලම්බු පීඑල්සී (යූනියන් බැංකුව), අංක 15ඒ, ඇල්ෆ්‍රඩ් පෙදෙස, කොළඹ 03 හෝ දුරකථන අංක : 011-2370870, 011-2274100 න් ලබා ගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 61/1, ප්‍රගති මාවත,
බංගලාවත්ත,
කොට්ටාව,
දුරකථන අංක : 071-4175944
075-8489378

06-19

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

*** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | **පිටපතක මිළ** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

**2011**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| ජුනි | 2011.06.03 | සිකුරාදා | 2011.05.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.06.10 | සිකුරාදා | 2011.05.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.06.17 | සිකුරාදා | 2011.06.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.06.24 | සිකුරාදා | 2011.06.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2011.07.01 | සිකුරාදා | 2011.06.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.08 | සිකුරාදා | 2011.06.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.15 | සිකුරාදා | 2011.07.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.22 | සිකුරාදා | 2011.07.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.07.29 | සිකුරාදා | 2011.07.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2011.08.05 | සිකුරාදා | 2011.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.12 | සිකුරාදා | 2011.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.19 | සිකුරාදා | 2011.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.08.26 | සිකුරාදා | 2011.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.